ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක: HRC/P/i/12/01/23

# මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය භාරයේ සිටියදී 2023.01.10 වන දින මිය ගිය වින්දිත සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු ස්වයං මැදිහත්වීමෙන් (Suo-Motu Intervention) ආරම්භ කර ඇත. ඒ අනුව 2023.01.12 වන දින විමර්ශනය සඳහා අදාළ ස්ථාන වෙත මානව හිමිකම් කොමිෂන් සභා නිලධාරීන් යොමුව මූලික පරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී.

මෙම මරණය සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය වාර්තා කැඳවා ඇති අතර, 2023.01.16 වන දින මෙම සිද්ධියට අදාළ වන සියළු පාර්ශවයන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවැත්වෙන පරීක්ෂණයට කැඳවීමට නියමිතය.

පසුව මෙම මරණය සම්බන්ධයෙන් වින්දිත පාර්ශවයේ ඥාතීන් විසින් ද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ද ගොනු කර ඇත.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2023.01.12